**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!**

# ධම්මපදය

## චිත්ත වර්ගය (04 ගාථාව)

**4.** ගාථාව

**සුදුද්දසං සුනිපුණං - යත්‍ථ කාමනිපාතිනං,**
**චිත්තං රක්ඛේථ මේධාවී - චිත්තං ගුත්තං සුඛාවහං.**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **සුදුද්දසං** | - පැහැදිලි ව දැකීමට ඉතාමත් අපහසු වූ, |
| **සුනිපුණං** | - ඉතා සියුම් වූ, |
| **යත්‍ථ කාමනිපාතිනං** | - කැමති යම් අරමුණක වැටෙනසුලු වූ, |
| **චිත්තං** | - සිත, |
| **මේධාවී** | - නුවණැත්තේ, |
| **රක්ඛේථ** | - රක්නේ ය (රැකිය යුතු), |
| **ගුත්තං චිත්තං** | - රක්නා ලද සිත, |
| **සුඛාවහං** | - (ලොවුතුරු) සුව එළවන්නේ ය. |

**භාවාර්ථය**

බුද්ධිමතා දැකීමට ඉතා අමාරු වූ, ඉතා සියුම් වූ, කැමති කැමති අරමුණක වැටෙන්නා වූ සිත රක්නේ ය. රක්නා ලද සිත සුව එළවන්නේ ය.

**නිදන කථාව**

බුදුරජුන් දවස සැවැත් නුවර එක්තරා සිටුපුත්‍රයෙක් වාසය කළේ ය. නිරන්තරයෙන් සිටුමැඳුරට වැඩ ඔවුන්ට ඔවදන් දෙන හිතවත් තෙරුන් වහන්සේ නමක් ද වූහ. එම තෙරුන්වහන්සේව ඇසුරු කිරීමේ හේතුවෙන් ඒ සිටුකුමරුගේ සැදැහැසිත බොහෝ දියුණු වූයේ ය. සිටුකුමරු සසර දුක ගැන සලකා කලකිරුණු සිත් ඇත්තේ ඒ දුක කෙළවර කර ගැනීමට සිතී ය. එයට තමන් ඇසුරු කරන කුලුපග තෙරුන්ගෙන් උපදෙස් පැතී ය. තෙරණුවෝ ද ඔහුගේ සිතෙහි කසට මැඩීම සඳහාත් පිළිවෙත්හි පිහිටුවීම සඳහාත් සුදුසු අවවාද දුන්හ.

කුලුපග තෙරුන්ගේ අවවාද හිස්මුදුනින් පිළිගත් සිටුපුත් තෙමේ සඞ්ඝයාට නිබඳ ව දන් දීමාදියෙන් සලාක-බත්, අඩමස්-බත්, වස් විසූ කල දෙන බත්, ආදි ඒ ඒ කලට සුදුසු වතාවත් නො කඩවා කරමින් සිවුරු-පිරිකර පූජා කිරීම් ආදි සිවුපසයෙන් උවටැන් කළේ ය. නිති පන්සිල්, පොහොය අටසිල්, ගෘහස්ථ දසසිල් ආදියෙහි ද පිහිටියේ ය. තෙරුන් වහන්සේගේ ඔවදන් පරිදි මේ සියල්ල මනා ව පිළිපදිමින් තවත් කළ යුතු දේ වේතොත් එය ද වදළ මැනවැ'යි අයැද සිටි කල්හි, තෙරණුවෝ එසේ නම් පැවිදි වන්නැ'යි කියා කුමරුට පැවසූහ. කම්සැපෙහි නිසරුකම ගැන කලකිරී සිටි ඔහුට ඒ වචන බොහෝ සතුටට හේතු වූයෙන් අනතුරු ව පැවිදි බවට පත් විය.

ඒ සිටුකුමරුන්ගේ පැවිදි ගුරුවරුන් අතර එක භික්ෂුවක් අභිධර්මය උගත් භික්ෂුවකි. අනෙක් භික්ෂුව විනයධර හිමිනමකි. ආභිධම්මික භික්ෂුව ඔහුට අභිධර්මය උගන්වයි. විනයධර භික්ෂුව 'මේ සසුනෙහි මේ දේ කළ යුතු ය, මේ දේ නො කළ යුතු ය, මෙය කැප ය, මෙය අකැප ය'යි ආදි වශයෙන් විනය උගන්වයි. මෙසේ ඉගෙන ගන්නා ඒ භික්ෂුවට 'පැවිදි ජීවිතය නම් ඉතා දුෂ්කර දෙයකි. මෙහි අත දිගු කිරීමට තරම්වත් නිදහසක් නැත. එනිසා ගිහි ව කටයුතු කරන්නෙමි'යි සිතා උකටලී ව ඉගෙනීම්, වත්පිළිවෙත් කිරීම් ආදිය අතපසු කරමින් වසයි. ඔහු සිතට වසඟ ව කටයුතු කරන බව දුටු ගුරු හිමිවරු එම භික්ෂුව බුදුරජුන් වෙත පැමිණවූහ. එහි දී බුදුරජාණන් වහන්සේ තොරතුරු විචාරා සිත දමනය කිරීමේ අනුසස් වදරා දහම් දෙසූ සේක. දේශනාව කෙළවර ඒ භික්ෂු තෙමේ සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය,
උග්ගල්බොඩ, ගම්පහ.
**Tel: 077-3811301 / 071-4417813**
**Email: info@sadaham.net**
**(නිකිණි 2553)**

**සම්පාදක:** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ප්‍රධාන අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේ

**ධර්මදානය:** පින්වත් සනත් කොඩිතුවක්කු උපාසක මහතා, සත්මි දියණිය සහ රසිකා මාලගේ මහත්මිය විසින් මාතර, හිත්තැටිය (නැගෙනහිර) පදිංචි ව සිට අභාවප්‍රාප්ත වූ දයාපාල කොඩිතුවක්කු පියාණන්ට සහ ධර්මාවතී ලියනගේ මෑණියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස සහ තමන්ට ධර්මාවබෝධය පිණිස මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්-ලිපි* **www.sadaham.net** *යන 'වෙබ්' අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**